Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව
## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 9

අප්‍රේල් මාසය -1 සතිය

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති
ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

## පුනරීක්ෂණ අභ්‍යාස -1

(1)

i. බිලාවල් රාගයට අදාළ විස්තර ඇතුළත් කර පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| රාගය | ආරෝහණ | අවරෝහණ | වාදී | සංවාදී | ජාතිය | ගානසමය | මුඛ්‍යාංගය | ස්වර සංගති | විශේෂ තොරතුරු |
|---|---|---|---|---|---|---|---|---|---|
| බිලාවල් | | | | | | | | | |

ii. ග ප ධ නි /ස̊- ධ ප/- - - -/ස රි ස - මෙම ගී පාදය බිලාවල් රාගයේ සර්ගම් ගීයේ ආරම්භක පාදයයි. එහි තෙවන විභාගයට අදාළ වන ස්වර කොටස ලියන්න.

iii. සරිස, සරිගමප මගමරිස..... මෙම ස්වර අභ්‍යාසය බිලාවල් රාගයට අනුව උච්ච සඩ්ජය දක්වා ගොඩනගන්න.

iv. බිලාවල් රාගයට අයත් මධ්‍යලය ගීතයේ ස්ථායි /අන්තරා කොටස් නියමිත තාල සංඥා සහිත ව ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(2) රාගධාරී සංගීතය පිළිබඳ පහත දැක්වෙන ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරන්න.

i. රාගයකට අයත් ස්වර වලින් පමණක් ප්‍රබන්ධ වූ ගීත විශේෂය ..............නමින් හැඳින්වේ.

ii. ආරෝහණයේදී ස්වර 7ක් සහ අවරෝහණයේදී ස්වර 5ක් යෙදෙන රාගයක ජාතිය ..............වේ.

iii. ගායනය හෝ වාදනය සඳහා යොදා නොගන්නා, රාග උත්පාදනය සඳහා විශේෂිත වූ ස්වර සමූහය .............. නම් වේ.

iv. ශුද්ධ ස්වර පමණක් ඇතුළත් ව .............. මේලය ගොඩනැගී ඇත.

v. බිලාවල් රාගයේ අනුවාදී ස්වර .............. ලෙස යෙදේ.

(ස රි ම ප නි/ බිලාවල්/ සර්ගම්/ මේලය/ සම්පූර්ණ - ඖඩව)

(3) පහත සඳහන් හිස්තැන්වලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

රාගයක යෙදෙන ප්‍රබල ම ස්වරය (1)..............ස්වරය නමින් හැඳින්වෙන අතර එම ස්වරයට පසුව යෙදෙන දෙවන ප්‍රධාන ස්වරය වන්නේ (2).............. ස්වරයයි. එම ස්වර දෙක ම හැරුණු විට රාගයේ ඉතිරි ස්වර (3)..............ස්වර නම් වන අතර රාගයක් අලංකාර කිරීම සඳහා ඉඳහිට යෙදෙන ස්වර (4)..............ස්වරය ලෙස හැඳින්වේ. මේලයකට අයත් වුව ද රාගයක කිසිසේත් ම නොයෙදෙන ස්වර (5)..............ස්වර නමින් හැඳින්වේ.

i. වර්ජිත ස්වර ii. සංවාදී ස්වර iii. විවාදී ස්වර iv. වාදී ස්වර v. අනුවාදී ස්වර

(4)

i. මව්පිය ගුණ වර්ණනා කරමින් දරු පරපුරට ආදර්ශමත් අදහස් ප්‍රකාශ කරන්නා වූ පදමාලා ඇතුළත් ගීත විශාල ප්‍රමාණයක් මේ වන විට ශ්‍රව්‍ය/දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වන බව බොහෝ දෙනා දන්නා කරුණකි. විෂය නිර්දේශය තුළදී මේ පිළිබඳ ඔබ ලබා ගත් දැනුමත්, ගීත රසවින්දනය ආදී ස්ව අධ්‍යයන තුළින් රැස් කර ඇති තොරතුරුත් පාදක කොට පහත වගුව සම්පූර්ණ කරන්න.

| මව් ගුණ ගීත 5ක් ලියන්න. | පිය ගුණ ගීත 5ක් ලියන්න. | මව්පිය ගුණ ගී ගයන ගායක /ගායිකාවන් |
|---|---|---|
| 1 | 1 | 1 |
| 2 | 2 | 2 |
| 3 | 3 | 3 |

ii. "ආදරයේ උල්පත වූ අම්මා"ගී පදමාලාවේ ධ්වනිතාර්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(5)

i. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

- නූර්ති සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ
- සරල ගීතයක ආකෘතිය
- වර්ජිත ස්වර
- මූලික රාග ජාති